ඡන්ද සංඛ්‍යාවටත් වැඩිය ශ්‍රී.ල.නි.ප.යේ සහය ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට දෙනවා කියලා තීන්දුව ගැනීමම එතුමාගේ ජයග්‍රහණයට වැදගත් වුණා. ඒ තීන්දුව ගැනීම තුළ, මේ පැත්ත තමයි දිනන්නෙ කියලා, රටේ මතයක් ඇති වුණා. විචාර බුද්ධියෙන් සහ අපක්ෂපාතීව, මධ්‍යස්ථව හිතන අය පිරිසක්, ශ්‍රීලනිපය ගන්න තීන්දුව දිහා බලාගෙන හිටියා. අපි තීන්දුවක් ගන්න කලින් ඒගොල්ලෝ කිව්වේ ''ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගන්න පැත්ත තමයි දිනන්නෙ...'' කියලා. අපි ගෝඨාභය මහත්තයට සහයෝගය දෙන්න තීන්දු කළාට පස්සේ, අපේ තියෙන සංඛ්‍යාත්මක ඡන්ද සංඛ්‍යාවේ අගයට වඩා, පාවෙන ඡන්ද සහ මධ්‍යස්ථ ඡන්දවල නැම්මක් ඇති වුණා.

**ප්‍රශ්නය : ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය පිළිබඳව ඔබ සතුටු වෙනවාද...?**

පිළිතුර : පැහැදිලිවම ඉතාම සතුටු වෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලේ, 2014 ට කලින් ඉඳලා අපේ හිතවත්කම් තිබුණා. 2014 දී එදා රාජපක්ෂ ආණ්ඩුවෙන් මම එළියට යන්න හදපු වෙලාවේදී, මාව ආණ්ඩුව තුළ රඳවගන්න ලොකු උත්සාහයක් ගත්ත කෙනෙක් ගෝඨාභය මහත්මයා. ඒ වගේ තව සිද්ධි ගණනාවක් කියන්න පුළුවන්. පැහැදිලිවම රටේම ජනතාවගේ ඡන්දය පාවිච්චි කිරීම තුළ පෙන්නුම් කරන දෙයක් තමයි අලුත් ආණ්ඩුවක අවශ්‍යතාවය. මම ආණ්ඩු කරන-කොට ආණ්ඩුව තුළ තිබුණු ගැටුම් කාටත් රහසක් නෙමේ. ඒක ප්‍රතිපත්තිමය ගැටුමක්. ඒ ප්‍රතිපත්තිමය ගැටුම්වල ප්‍රශ්න රාශියක් ඇති වුණා. මේ රටේ පාර්ලිමේන්තු බලයක් නැතුව, ජනාධිපති වුණ කෙනා මම. හැම ජනාධිපතිවරයකුටම තමන්ගේ ප්‍රතිපත්ති සහ තමන්ගේ දර්ශනය ක්‍රියාත්මක කරන්න පාර්ලිමේන්තුවක් තිබ්බා. ඒවගේම තමන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න, තමන්ගේ පක්ෂයෙන්, තමන්ගේ කැබිනට් මණ්ඩලයක් තියෙනවා.

මට පාර්ලිමේන්තුවත් නෑ. කැබිනට් මණ්ඩලයත් නෑ. මම ජනාධිපති වෙලා රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති කළාට පස්සේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇත්තටම ජනාධිපතිවරයා කියලා වැඩ කරන්න පටන් ගත්තා. ඕක තමයි ඇත්ත කතාව. ඒත් එක්කම එතුමාගේ සහ මගේ ප්‍රතිපත්ති ගැටුම් රාශියක් ඇති වුණා. ඒවගේම මහබැංකු කොල්ලය වැනි බරපතළ දූෂණ වංචා, සිංගප්පූරු ගිවිසුම වැනි මම තහනම් කරපු ගිවිසුම්, ඇමරිකන් ගිවිසුම් තුනක් ආවා. මම ඒවා එකක්වත් අත්සන් කරන්න දුන්නේ නෑ.

පහුගිය අවුරුදු හතරේත් මට දැඩි ලෙස එන් ජී ඕ වලින් ගැහුවා. එතකොට මම ජනාධිපති කාලේ, මට වැඩිපුරම ප්‍රහාරය එල්ල කරපු සමාජ මාධ්‍ය ජාලාවල මට ගහපු කට්ටිය තමයි එන්ජී ඕ... එන්ජී ඕවල මෙහෙ තිබුණේ වලිගේ විතරයි, ඔලුව තිබුණේ මුහුදෙන් එතෙර. ඒ නිසා තමයි මම එන්ජී ඕවලට ගැහුවෙ. මම 2018 ඔක්තෝම්බර් 26 මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති විදිහට පත් කරා. දවස් පනස් දෙකක්, ඒ වෙච්ච අර්බුදය කාටත් මතකයි. අවසානයේ අධිකරණ තීන්දුව නිසා රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැති විදිහට පත් කරන්න සිද්ධ වුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයා සහ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය ළඟින් තියාගෙන එදා මම පැයක දේශනයක් දුන්නා. ඒක ඓතිහාසික දේශනයක්. තමන්ගේ අගමැතිවරයාට සහ තමන්ගේ ඇමැති මණ්ඩලයට ඒ දුන්න දේශනයේ පැහැදිලිවම කිව්වා, තමුසෙල මේ බරපතළ වැරදි කරනවා. ඒ නිසා තමුන්ගේ අනාගතයේ බරපතළ තත්ත්වයක් ඇතිවෙයි කියලා. එදා මම කිව්ව දේට තමයි එජාපය මුහුණ පෑවේ.

**ප්‍රශ්නය . අප මේ සාකච්ඡාව සිදු කරන ඔබගේ නිල නිවස ඔබ විසින් බලෙන් පවරාගෙන තිබෙන බවට ප්‍රචාරයක් පැතිරෙනවා. රුපියල් කෝටි අටසියයක වටිනා ගෙයක් ඔබ වැනි සරල ජනාධිපති ලෙස හඳුනාගත් පුද්ගලයෙක් හිමිකර ගැනීමේ සදාචාරාත්මක භාවය හැමෝම පාහේ ප්‍රශ්න කරනවා.**

පිළිතුර : මම දැක්කා පත්තරවල ඔය ගැන ලියලා තියෙනවා. මහා සුඛෝපභෝගී ගෙයක්, විශාල විශ්‍රාම වැටුපක් අරගෙන, දැන් මිනිහ හොඳට ජීවත් වෙන්න හදාගෙන තියෙනවයි කියලා. ජනාධිපතිවරයකුගේ නිල කාලයේ දී ලැබෙන වැටුප රුපියල් අනූ පන්දාහයි. ඒ අනූපන්දාහ තමයි විශ්‍රාම වැටුපක් විදිහටත් දෙන්නේ. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවෙන් සම්මත කරපු පනතක් තියෙනවා, ඒ පනත 1986 අංක 04 දරණ ජනාධිපති හිමිකම් පනත. ජනාධිපතිවරයෙක් වැඩ කරන කාල සීමාවක් තුළ ජනාධිපතිවරයකුට තියෙන පහසුකම් සහ විශ්‍රාම ගිය පසු තිබෙන පහසුකම් පිළිබඳව සඳහන් වන්නේ ඒ ජනාධිපති හිමිකම් පනතේ. මට කලින් ජනාධිපතිවරු පස්දෙනෙක් හිටියා. ඒ පස් දෙනාටම ලැබිච්ච දේවල් ඇරෙන්න විශේෂ කිසි දෙයක් මට ලැබිලා නෑ. ඒ පස්දෙනාටම නිවාස ලැබිලා තියෙනවා. එතකොට මම මේ පදිංචි නිල නිවසේ ඉඩමේ වටිනාකම කොච්චරද. ගෙයි වටිනාකම කොච්චර ද කියලා මම දන්නෙ නෑ. මට ඒවා වැඩකුත් නෑ. ඒවා රජයේ දේපල.

**ප්‍රශ්නය : මනම්පිටියේ වැලි සඳහාත් ඔබගේ නම කියවෙනවා. ඔබගේ අනුග්‍රහය ලබන වැලි මාෆියාවක් පොළොන්නරුවේ තිබෙන බවට සමහරු චෝදනා කරනවා.**

පිළිතුර : වැලි කර්මාන්තය කියන්නේ අන්ත දූෂිත කර්මාන්තයක්. පහුගිය ජනාධිපතිවරණයෙන් පස්සේ ඔය කණ්ඩායමක් එළියට බැහැලා උද්ඝෝෂණ කරනවා. මේ කණ්ඩායම තමයි ඔය ජාවාරමේ ඉන්නේ. ඔය කණ්ඩායම තමයි ළඟදි බෝඩ් උස්සගෙන කෑ ගැහැව්වේ. ඔය කණ්ඩායමට වැරදි කරන්න මම ඉඩ දුන්නේ නැහැ. ඒ කට්ටිය තමයි අද පාරට බැහැලා ඉන්නේ. මගේ ධුර කාලයෙන් පස්සේ මේ කණ්ඩායම එළියට ආවා. 2015 මම ජයග්‍රහණය කරල මුලින්ම කරපු දේ තමයි, මනම්පිටියේ වැලි ගොඩදාන එක නවත්තපු එක. පුද්ගලික අයට වැලි බලපත්‍ර දීලා ගඟ විනාසයි. පරිසරය විනාශයි. හැමදේම විනාශ වුණා. පුද්ගලික අංශයට වැලි බලපත්‍ර දෙන එක තහනම් කළේ මම. හයෙන් පස්සේ වැලි ප්‍රවාහනය තහනම් කළේ මම.

මගේ ධුර කාලය තුළදී ඔය වැලි ජාවාරම්කාරයන්ට මම කිසිම ඉඩක් දුන්නේ නෑ. ඒ කණ්ඩායම අද එළියට බැහැලා ඉල්ලන්නේ, මම දෙන්න බැහැ කියපු දේ. මගේ ධුර කාලේ ඉවර වුණ ගමන්ම ඒගොල්ලන් ජාවාරම් කරන්න අයිතිය ඉල්ලනවා. ඒ අය තමයි ඔය පාරවල්වල බෝඩ් උස්සන් කෑගැහුවේ.

පෞද්ගලික අංශය වැලි ගොඩ දාන එක නවත්තලා, භූ විද්‍යා හා පතල් කාර්යංශයට මම භාරදුන්නා. ඊට පස්සේ රජයෙන් තමයි ඒ කාර්යය කළේ. වැලි සහ පස් කියන්නේ පාතාලයේ ජාවාරමක්. මේ ආණ්ඩුවේ වැලි, ගල්, පස් ප්‍රවාහන බලපත්‍රය අහෝසි කරපු එකෙන් බලාපොරොත්තු වුණේ සංවර්ධනයට වැලි, ගල්, පස් සුලබ කරන එක. අනිත් කාරණය තමයි මිල පහළට ගෙන ඒම. මම හොයල බැලුවා එහෙම කොහේවත් මිල අඩුවෙලා නෑ. ඒකට හේතුව මේක පිටිපස්සේ ඉන්නේ ජාවාරම්කාරයෝ. මේ ජාවාරම්කාරයෝ ගඟ විනාස කරනවා, වැව විනාශ කරනවා, ඉවුරු විනාශ කරනවා, සම්පූර්ණ පරිසරයම විනාශ කරනවා. මම තමයි මනම්පිටියේ ඔය ජාවාරම නැවැත්තුවේ.වැලි, ගල්, පස් මාෆියාව ගැන ද, රෝයල් පාක් සිද්ධිය ගැන ද, මගේ නිල නිවස ගැන ද, ඕනම දේකට මහා සභාවක සංවාද කරන්න මම ලෑස්තියි. පොළොන්නරුවේ ඡන්ද අඩු වුණ හේතුවද, ඕන එකකට මම සූදානම්.

**ප්‍රශ්නය : මහින්ද රාජපක්ෂ මහතාට අගමැතිකම ලබාදීමට පෙර සජිත් ප්‍රේමදාස මහතාට අගමැතිකම ලබාදීම සඳහා ඔබ ආරාධනා කර තිබුණා. ඒ සජිත් ප්‍රේමදාස මහතා ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වුණා. සජිත් මහත්තයාගේ පරාජය පිළිබඳව ඔබට විග්‍රහයක් තියෙනවද?**

පිළිතුර : පසුගිය ජනාධිපතිවරණයට එක්සත් ජාතික පක්ෂයෙන් කොච්චර හොඳ අපේක්ෂකයෙක් ඉදිරිපත් කරත් ඔහු පරදිනවා. ඒක තමයි ඇත්ත.ඒක අපේක්ෂකයාගේ වැරැද්දක් නෙවෙයි. අවුරුදු හතරහමාරක, අන්ත දූෂිත ආණ්ඩුවට ජනතාව දුන්න උත්තරයක්.මමත් ඔය ආණ්ඩුවේ හිටපු කෙනෙක් කියලා කෙනකුට කියන්න පුළුවන්. මම ඒ ආණ්ඩුවේ ගහ ගත්ත මිනිහෙක්. මම ආණ්ඩුව ඇතුළේ ගහ ගත්තෙ අතින් පයින් නෙවෙයි. හොරකමට, දූෂණයට, වංචාවට, ජාත්‍යන්තර පාවාදීම්වලට, හාමුදුරුවරු අත්අඩංගුවට ගැනීමට, රණවිරුවන් හිරේ දැමීමට, පෙරහැරට අලි නොදෙන එකට, මේවා එක්ක මම දිගටම සටන් කරා. ඔබ අහපු ප්‍රශ්නයට සරල උත්තරයක් දෙනව නම්, පසුගිය ජනාධිපතිවරණය එක්සත් ජාතික පක්ෂයෙන් කවුරු ආවත් පරාජය වෙනවා.

දැන් බලන්න මහබැංකු කොල්ලය, මං ඒකට මැදිහත් වෙලා කොමිසමක් දැම්මා. ඔය කොමිසමේ වැඩ කරපු පොලිස් නිලධාරින්ට විරුද්ධව පරීක්ෂණ කරන්න, අගමැතිතුමා තීරණය කළා. ඕක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිලධාරීන්ට පුළුවන් තරම් බලපෑම් කරා. ඉතින් ජනතාව මේ වගේ ආණ්ඩුවක් තියාගනියිද?

මාව ඝාතනය කරන්න ලංකාවේ විවිධ කණ්ඩායම් රාශියක් හිටියා.

**ප්‍රශ්නය : ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය ළඟදීම පැමිණීමට නියමිතයි. ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයේදී ඔබගේ ස්ථාවරත්වය කුමක්ද...?**

පිළිතුර : ස්ථිර වශයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් මම මහ මැතිවරණයට ඉදිරිපත් වෙනවා. ඒක තමයි මගේ බලාපොරොත්තුව.

**ප්‍රශ්නය : ඒ කියන්නේ ඔබ විශ්‍රාම යන්නේ නැහැ?**

පිළිතුර : මොකක්ද ඒකෙ තේරුම? හිටපු ජනාධිපතිවරයා ආපහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන එක හොඳද?

(සිනාසෙමින්)

ඕකෙ පූර්වාදර්ශය දුන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයානේ.

මහින්ද රාජපක්ෂ මහත්තයා නම් ඡන්දෙ පරාජය වෙලා පාර්ලිමේන්තුවට ගියා. මම ඡන්දෙ පරාද වෙච්ච කෙනෙක් නෙමෙයිනේ. අනිත් එක මම දේශපාලන වශයෙන් සංවේදී සජීවී පුද්ගලයෙක්.

උදාහරණයකට, දොස්තර මහත්තයෙක් හැටෙන් විශ්‍රාම ගියාට එයා බෙහෙත් දෙනවා. එක නවත්වන්නෑ. ඉංජිනේරුවෙකුත් එහෙමයි. මිනින්දෝරුවෙකුත් එහෙමයි. ගුරුවරයත් එහෙමයි. ඉතින් ඇයි දේශපාලනඥයාට ඒක කරන්න බැරි?

කුහක හිතින් හිතන්නැතුව බලනවනං, ඕන කෙනෙකුට තේරෙනවා, මං මඩ නොගා ගත්ත මිනිහෙක් කියලා. මම හැමවෙලේම රටට යහපත් දේ කරන්න සහ කරපු කෙනෙක්... මගේ දේශපාලන ජීවිතය පිරිසිදුයි. මනුස්සයෙක් උනහම තමන් ජීවත්වෙලා ඉන්න කාලෙදී රටට ලෝකෙට මොනවා හරි කරන්න ඕනේ. මගෙන් කවදාවත් රටට නරකක් සිද්ධවෙලා නෑ. ඒ නිසා මං ඒ දේ රට වෙනුවෙන් කරනවා.

මම මැතිවරණයට ඉදිරිපත් වෙනවා. ගෝඨාභය මහත්තයට ශක්තිමත් ආණ්ඩුවක් දෙන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරි මැතිවරණයේදී කටයුතු කරනවා.

**සාකච්ඡා කළේ .**
**මනෝජ් අබයදීර**

